# Living the LOTUS

Buddhism in Everyday Life

12
2017

VOL. 147




FOUNDER'S ESSAY

## බුදුන් වහන්සේගේ ආශිර්වාදය

මේ වසරේ අවසානයත් කෙමෙන් ළඟාවෙයි. ආර්ථික දුෂ්කරතා, ස්වභාවික විපත්, අසනීප ආදිය නිසා 'කරදරයක් නැතිව මේ වසර ගතවුනා' ලෙස අවංකවම පැවසීමට නොහැකි පිරිසද සිටින්නට පුළුවන. නමුත්, කරදර වැඩිපුරම තිබු අවුරුද්ද, කෙසේ පිළිගත යුතුද යන්න ඉතා වැදගත් යැයි සිතමි. බුදුන් වහන්සේ අපි සියළුදෙනාම උන් වහන්සේගේ දරුවන් ලෙස භාරගෙන, 'අනිවාර්යයෙන්ම මම ආරක්ෂා කරමි' ලෙස පොරොන්දු වී සිටියි. අප එම වදන් තදින්ම විශ්වාස කළ යුතුය.

මේ වසරේද නොයෙක් ආකාරයේ දුක් වලට මුහුණදෙමින්, උත්සහයෙන් හා කැපවීමෙන් කටයුතු කළ අපව බුදුන් වහන්සේ නිතරම ආරක්ෂා කරයි. බුදුන් වහන්සේ විසින්, උන් වහසේගේ දරුවන් වන අපට කොපමණ ශක්තියක් තිබේදයන්න විශ්වාසයෙන් සිටියි.

තම දරුවාව ඉතා ශක්තිමත් ආකාරයෙන් හදවඩා ගැනීමට දෙමාපියන් නොයෙක් ආකාරයට කටයුතු කරන අයුරින්, බුදුන් වහන්සේත් මේ මොහොතේ අපිට හොඳින්ම අත්‍යාවශය දේ ලබාදෙයි.

සිතේ සැනසුම යනු, කිසිම දෙයක් ඇති නොවෙනවා නොවෙයි, මොන දේ සිදු වුවත්, ඒවා ජයගැනීමේ ශක්තිය ගොඩනගා ගැනීමයි. ඉතා දරුණු සිදුවීම් වුවද අප තුල ඇති ශක්තිය උරගා බලන්නාවු බුදුන් වහන්සේගේ ආශීර්වාදය යැයි, අවබෝධ වන අවස්ථාවක් අනිවාර්යයෙන්ම පැමිණේවී.

*Kaiso zuikan* 9 පි. 300-301


Living the Lotus
Vol. 147 (December 2017)



Rissho Kosei-kai International
Fumon Media Center 3F, 2-7-1 wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international
@kosei-kai.or.jp



**Senior Editor:** Koichi Saito
**Copy Editor:** P.A.D. Somapala, G.N. Ruklanthi
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදි. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදිත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන , සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදි නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජිවීතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරිම සිදු කරනු ලැබේ.

*President's Message*

# තම ජීවිතයට 'හැඩයක්' බද්ධ කර ගැනීම





නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා



## 'හැඩයත්' උපාය කෞශල්‍යයකි

ජුදෝ හා කෙන්දෝ ක්‍රීඩා වලදී මෙන්ම, චිත්‍ර කලාව හා ප්‍රාසාංගික කලාවේද ආදර්ශයට ගන්නා පිරිස් හා ක්‍රියාවන්ගේ 'හැඩයක්' ඇතැයි පවසයි.

එසේ, කලාත්මක ලෝකයට සීමා නොවී, අපගේ එදිනෙද ජීවන චර්යාවන්ගේද 'හැඩයක්' ඇති බව මම විශ්වාස කරමි.

උදහරණයක් ලෙස වේලාවට වැඩ කිරීම, 'සුභ උදෑසනක්' ලෙස උදෑසන පවුලේ අයට ආචාර කිරීම, සපත්තු සෙරෙප්පු පිළිවෙලකට තැබීම, කෙනෙක් ඇමතු විට 'ඔව්' ලෙස පිලිතුරු දීම ආදිය 'හැඩයන්' ලෙස තම ජීවිතයට බද්ධ කරගෙන, එදිනෙද පුරුදු පුහුණුවේ යෙදීම ඉතා වැදගත් යැයි සිතමි.

කෙසේ වෙතත්, 'හැඩය' යනු, බුදුදහමේ සදහන් පරිදි ''සිත, කය, වචනයේ ක්‍රියාකාරිත්වය වේ''. එනම් අපගේ ක්‍රියාවන් හා වදන් වලින් සිතුවිලි පිටතට පැමිණීම සිදු වන නිසාය.

එසේනම් සිත යනු කුමක්ද? කුමනාකාරයේ 'හැඩයක' සිත බද්ධ කර ගැනීම වැදගත් වන්නේද?. පිලිතුර නම්, අන් අය ගැන හිතන, මෛත්‍රිය සහගත හැඩයකින් යුතු සිතක් බද්ධ කර ගැනීම වැදගත් වේ. අන් අය ගැන සිතන, මෛත්‍රිය සහගත සිතුවිලි 'හැඩයන්' ලෙස පුද්ගලත්වයට ආරෝපණය කර ගෙන එදිනෙද පුහුණුවේ යෙදීම තුලින්, මෛත්‍රිය කරුණාව අපගේ හදවතට තව තවත් බද්ධ කර ගැනීමට හැකි වේ.

බුද්ධ මාර්ගයේ ගමන් කරන අපගේ ජීවන ශෛලීයේ හා රිද්මයේ වැදගත්ම 'හැඩයන්ගෙන්'1 ක් වන්නේ, එකි නෙකාට ගෞරව නමස්කාර කිරීම හා උදෑසන සවස සූත්‍ර සජ්ඣායනය කිරීමත් වේ. ඒ ආකාරයේ පුහුණුවීම් තුලින්, 'අන් අය ගැන සිතීමට හා කෘතවේදී හදවතින් ජීවිතය ගත කිරීමට හැකිවේ', එය වැදගත්ම ආධ්‍යාත්මික දියුණුව වේ.

'හැඩයක්' තම ජීවිතයට බද්ධ කර ගැනීමෙන්, හදවතේ කැළඹීමක් ඇති වු විට වුවත්, ඉක්මණින්ම අන් අය ගැන සිතීම හා මෛත්‍රියේ හදවතට යලි පැමිණීමට හැකි වේ.

එම අරුතෙන් 'හැඩයත්', උපාය කෞශල්‍යයක් යැයි පැවසිය හැකිය. වාගේම ඒ හා සමානව නිතරම අන් අය ගැන සිතන හා මෛත්‍රියේ හදවතට සෘජු සබධතාවක්ද ඇති වේ.

## ‘හැඩය’ ආත්මාර්ථකාමීත්වය නැති කර ගැනීමේ පුහුණුයි

අන් අය ගැන සිතීම හා මෛත්‍රියේ කරුණාවේ හදවත, සාමාන්‍ය ජීවිතයේ ‘හැඩය’ හි පදනම වේ. එය විද්‍යාමාන වන චර්යයාව හෝ ක්‍රියාවන් ‘මේ අකාරයටම විය යුතුය’ යන තීරණයන් නැත. මේ ලෝකයේ එක හා සමාන පුද්ගලයන් නොමැති නිසා, අන් අය ගැන සිතීම හා මෛත්‍රියේ කරුණාවේ හදවත පිළිඹිබු වන ආකාරයේ ‘හැඩයද’, එකිනෙකාගේ පෞෂත්වයට අනුව විවිධාකාර වීම ස්වභාවිකය. එසේම, සූත්‍ර සක්ඣායනය කළ යුත්තේ බිම හිදගෙන යැයි පැවසුවත්, දණහිස් අමාරුව නිසා බිම හිද ගැනීමට නොහැකි අයද සිටියි.

එසේ නොකිරීම ‘හැඩයට’ විරුද්ධ චර්යයාවක් ලෙස පැවසීමටද නොහැකිය. එහිදී නිතරම වැදගත් වන්නේ, යම් කටයුත්තක් කිරීමේදී තිබෙන හැඟීම හා ප්‍රාර්ථනය අමතක නොකිරීම අත්‍යාවශම දේ වන බවයි.

එම අරුතින්, තමන්ට අවශ්‍ය ආකාරයට ‘හැඩයන්’ බිහි කිරීම, නියම ‘හැඩයක්’ බවට පත් නොවේ. එනම්, ‘තමන් සිතන ආකාරයට සෑම දෙයම විය යුතුය’ යන ආත්මාර්ථකාමි හදවත මර්ධනය කර ගැනීම සදහායි ‘හැඩයක්’ පවතින්නේ.

සමහර අවස්ථාවලදී පවුලේ අය හෝ දන්නා හදුනන අයගේ මූහුණ බලන්නවත් කැමති නැති, කියනදේ අහන්නවත් කැමති අවස්ථාවන් පවා තිබෙන්නට පුළුවන. එම අවස්ථාවල උදෑසන අවදිව ඔවුන් සමඟ කටයුතු කටන්නා සිදුවන විට අපහසුතාවයට පත්වේ. නමුත්, එකි නෙකාට ගෞරව නමස්කාර කිරීම, ‘සුභ උදෑසනක්’ ලෙස උදෑසන පවුලේ අයට ආචාර කිරීම ‘හැඩයක්’ ලෙස ජීවිතයට බද්ධ කරගෙන සිටින විට, ‘මුහුණ බලන්නට අකමැතියි’ යන ‘ආත්මාර්ථකාමිත්වය’, එම ‘හැඩය’ තුලින් තුරන් වී, ස්වභාවයෙන්ම ‘පරාර්ථකාමි’ තත්වයට පත්වේ. එසේම ආචාර කිරීම, සමානාත්මතාව ඇති කරන පළමු පියවර බවට පත් වනවාසේම, සුභ පතන පුද්ගලයාගේ හදවතද සන්සුන් තත්වයට පත්වේ.

නමුත්, නිතරම ‘හැඩයට’ අනුවම ‘කටයුතු කළ යුතුයි’ ලෙස තිබෙන විට, තමන්ගේ පහසුව වැදගත් කොට කටයුතු කරන අප වුවද, දොස් පවරමින් වුවත් අපහසුවකින් තොරව කටයුතු කිරීම ‘පරාර්ථකාමිත්වයට’ පත්වන මොහොතක් බවට පත්වේ.

අප සංවිධානයේ හෝසා හා සූත්‍ර සක්ඣායනයන්, ‘අන්‍යයන් ප්‍රථමයෙන්’ යන පුහුණුවද, දිගින් දිගටම පුහුණුවීම තුලින් බුදුන් වහන්සේ හා සමානව මෛත්‍රියෙන් යුතු පුද්ගලයෙකු බවට පත් වන්නාවූ ‘සතුටේ දිශාව’ පෙන්වන අප සංවිධානයේ ඉතිහාසය ශක්තිමත් කළ වැදගත්ම ‘ හැඩයන්’ යැයි සිතමි.

From *Kosei*, December 2017



# මහා විපත් 3 කින් ඉගෙන්ගත් මෛත්‍රී කරුණාව

ශ්‍රී ලංකා ශාඛාව
දයා මදනායක

*මෙය 2017 ජූනි මස 06 වන දින නව ශ්‍රී ලංකා ශාඛාව විවෘත කිරීමේ උත්සවයේදී ඉදිරිපත් කළ සෙප්පෝවයි.*

සියළුදෙනාගෙන්ම අවසරයි.

රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ නව ධර්ම මන්දිරයේ බුදු පිළිම වහන්සේ නිරාවරණය කිරීම වෙනුවෙන් මාගේ හද පිරි පුජෝපහාරය පිරිනමමි.

මම, දයා මදනායක. 1955 වසරේ මැයි මස 11 වන දින කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටියාකුඹුර ප්‍රදේශයේ මාකුර ගමේ මම ඉපදුනේ. මාගේ පියා ගොවිතැන් කටයුතු කළ අතර, අම්මා ගෙදර දොර කටයුතු කරමින් එළවළු, අල බතල වගා කර තාත්තාගේ ගොවිතැන් වැඩ වලටද උදව් කලා. පවුලේ වැඩිමලා වු මම, නංගී හා මල්ලි සමඟ හැදී වැඩුනි.

තාප්ප හා කම්බි වැටවල් වලට ඉඩම් මායිම් නොවූ අපේ ගමේ වතු, වෙන්වී තිබුණේ ගස් පේලි වලින්. ගමේ ගෙවල් වල වැඩිහිටියගෙන් කුඩා දරුවන් වු අපට ආරක්ෂාව ලැබුණා. ඔංචිලි පදිමින්, ඔයේ නාමින් සතුටින් සෙල්ලම් කළ අපගේ කුඩා බඩගින්නට පිහිට වුවේ වත්තේ පිටියේ වැටී තිබුන අඹ, කජු, රඹුටන් ආදියයි. ලී වලින් සාදා තිබුන අපේ ගෙදර බුදු ගෙය තැන්පත් කර තිබුණේ මිදුලේ. අපි හැමදම උදේට හවසට මල් පූජා කලා. එලෙස ස්වභාව ධර්මයට මැදිව, ශ්‍රද්ධාවන්ත පවුල් පරිසරයක හැදී වැඩුනු මට, ශිෂ්‍යත්වය සමත් වී උසස් පාසලකට යාමට හැකිවිය.



*සෙප්පෝව ඉදිරිපත් කරන දයා මහත්මිය*

සතුටින් අවුරුදු 11 ක් එකට ජීවත් වු පවුලෙන් ඈත් වීම දුකක් වුවත්, ටික දවසක් යනවිට නේවාසිකාගාරයේ ජීවිතයට ටිකෙන් ටික හැඩ ගැහුනා. අපි පාසලේ බුදු මැදුරේදී සෑම දිනකම බුදුන් වැන්ද. වාගේම සෑම පොහොය දිනකටම පන්සල් යන අතර වෙසක්, පොසොන් පොහොයන් වලට සිල් සමාදන් වුනා. හැමදම රාත්‍රී නින්දට යාමට පෙර තුන් සූත්‍රය සජ්ඣායනා කලා.

හොඳින් අධ්‍යාපන කටයුතුද සිදු කළ නිසා සාමාන්‍ය පෙළ විභාගය හොඳින් සමත් වී උසස් පෙළ ජීව විද්‍යා අංශයට යොමු වුණා. ඒ කාලයේ අපේ පාසලට අළුතෙන් ගුරු මහත්මයෙක් පැමිණියා. මට පන්ති ශිෂ්‍ය නායිකාව ලෙස සර් සමඟ නිතරම එකට කටයුතු කරන්න සිදු වුනා. ටිකෙන් ටික කාලයත් සමඟම ආදරයකට පෙරලුන අපේ ගුරු ගෝල බැඳීම අවසාන වුයේ විවාහයෙනි. එත්කොට මට වයස අවුරුදු 21 කි.

ඉන්පසු මහත්තයා කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මාරු වීමත් සමඟ අපි කෑගල්ලේ වෙනම නිවසක පදිංචි වුනා. මම ඉතා සතුටෙන් ගෙදර දොර වැඩවල නියලුනා. අපේ පවුල් ජීවිතයට තවත් සතුට ගෙන දුන්නේ ලොකු පුතා කුෂිල්ගේ ඉපදීමයි. ඉන් වසරකට පසු, මහත්තයාට පොලොන්නරුවට මාරුවක් ලැබුණු නිසා, අපි 3 දෙනාම පොලොන්නරුවේ පදිංචියට ගොස් නව ජීවිතයක් ආරම්භ කළා.

පොලොන්නරුවේ දි ඉතා විශාල ව්‍යසනයකට මුහුණ දීමට අපට සිදු වුනා. එක් දිනක් සුපුරුදු පරිදි රෑට කෑම කාලා නිදාගෙන ඉන්න විට වැස්සකුත් සමඟම විශාල කුණාටුවක් ආවා. විශාල අඹ ගහක් ගෙයි වහලයත් කඩාගෙන ගේ තුලට වැටුනා. අපි දරුවත් රැගෙන ගෙයින් එළියට ආවත්, ඇවිඳ ගන්න බැරි තරමටම තද හුළඟ. දණ ගාගෙන ළඟ තිබුණ පාන් බේකරියකට ගොඩවැදුනා. අවට ගෙවල් වල 80 ක් වගේ පිරිසක් එතනට එකතු වුනා. අපේ ඇඳුම් හොඳටම තෙමිලා, කට්ටිය වැඩි නිසා ඉඳගන්න වත් තැනක් නොමැතිව හිටගෙනම සිටියා. එළිය වැටීගෙන එන විට වැස්සත් පායන්නට වුනා. එත් අපේ ගේ හොයා ගන්න බැරි තරමටම හැම තැනම ගස් වැටිලා, ගෙවල් කැඩිලා, ඒවාට යටවෙලා මිනිස්සුත් මැරිලා. ලොකු විනාශයක් වෙලා තිබුණා.

අපේ සන්තකයේ තිබුණ සියළුදෙයම නැති වී, ඇඳි වස්ත්‍ර

පමණයි අපට ඉතුරු වුනේ. එත් පවුලේ කිසිවෙකුටත් තුවාලයක්වත් සිදු නොවී අපගේ ජීවිත බේරීම ගැන සතුටක් ඇති වුනා. එතැන් සිට අපි දෙදෙනා නැවතත් උපරිම කැපවීමෙන් ජීවිතය ගොඩනඟා ගන්න උත්සහ කළා. එම කුණාටුවෙන් වසර 2 ක් ගතවී, යාන්තම් ජීවිතය ගොඩනඟාගෙන එන විට 2 වන ව්‍යසනයත් අප සොයා ආවා. ඒ ජුලි වර්ජනයෙන් මහත්තයාට රැකියා අහිමිවීමයි. එයින් දින 4 කට පසු අපේ දෙවෙනි පුතා සම්පත් ඉපදුනා. මාසික පඩියෙන් ජීවත් වු අපි මුදල් ඉතිරියක් කර තිබුණේ නැහැ. අතේ තිබුණේ රු.65 ක් පමණයි. පවුලේ ආර්ථිකය කඩා වැටෙමින් දෙවන වරටත් අපි ආගාධයට වැටුනා.

යහළුවන්, නෑදැයන්, පන්සලේ හාමුදුරුවන් හා දන්නා හඳුනන හැමෝම අපිට උදව් කළා. මහත්තයාට නැවත රැකියාව කවද ලැබේවිද දන්නෙත් නැහැ. හැමදාම අනික් අයට කරදර කරන්නත් බැරි නිසා අපි විකල්ප ආදායම් මාර්ග ගැන කල්පනා කළා. අපේ ගෙදර කාමර දෙකක් කුලියට දුන්නා, බත් පැකට් හදලා විකුණුවා, ගෙදර වත්තේ එළවළු හිටෙව්වා, බිත්තර ගන්න කුකුළන් ඇති කළා, වී පොරොන්දුවට කුඹුරු වැඩ කරලා වී ලබා ගත්තා. මහන්සි වී නොයෙක් නොයෙක් උපායන් යොදමින් ආදායම උපයන්න උත්සහ කළා.

ඒ ආකාරයට වසර 3 ක් ගත වන විට මහත්තයට නැවතත් රැකියාව සමඟ පොලොන්නරුව කච්චේරියට පත්වීමක් ලැබුණා. ආර්ථික දුෂ්කරතා මැද මමත් රැකියාවක් කළ යුතුය යන හැඟීම ඇති වුනා. මහත්තයත් එයට සහය දැක්වූ නිසා පොලොන්නරු කච්චේරියේම අනියම් ලිපිකරු තනතුරකට පත් වුනා. ඉන් වසර 2 කට පසුවයි තෙවෙනි පුතා අංජන ඉපදුනේ. දෙවෙනි අභියෝගයත් පවුලේ සැමගේ එක් වීමෙන් එසේ ජයගෙන කටයුතු කරන විට, 1696 දී සතුට නැවත වැඩිකරමින් මහත්තයාට උසස් වීමක් ලැබුණා. ඒ හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. එම ස්ථාන මාරුවත් සමඟ ගමන් වෙහෙස මත මහත්තයා අසනීප වීමට පටන් ගත්තා. ජීවිතයේ 3 වන අභියෝගයත් දෑස ඉදිරිපිට.

මහත්තයාගේ අසනීප තත්වය දරුණු තත්වයට පත්වී සැරින් සැරේ සිහි මූර්ජා වෙන්න පටන් ගත්තා. සමහර දවසට නින්දේදීත් සිහි මූර්ජා වුනා. මහත්තයාගේ අසනීප තත්වය නිසා දරුවෝ තුන් දෙනා හා මම ආර්ථික මෙන්ම මානසික පීඩනයට ලක් වුනා. අසනීප තත්වය මත මහත්තයා හේතුවක් නැතිව ගෙදර හැමෝටම බණින්න පටන් ගත්තා, සමහර දවසට අපිව එළියට දමලා දොර වහනවා, දරුවන්ගේ පොත්, ඇඳුම් එළියට විසි කරනවා. අසනීපයේ අතුරු ආබාධ වන්නට ඇති යැයි සිතන විට, නැවතත් සුපුරුදු පරිදි කිසිත් නොවුනාසේ අපිත් සමඟ කටයුතු කරනවා. දරුවන් සමඟ සෙල්ලම් කරනවා, කෑම බීම ගෙනත් දෙනවා, වෙනදාවාගේම පොත් පත් කියවනවා. මේ සිදුවන්නේ කුමක් දැයි පවුලේ සැවොම පුදුමයට පත් වුනා. ඒ සියළුම දෑ, මට දරාගැනීමට පුලුවන් වුනත් දරුවන්ට එය විශාල මානසික පීඩාවක් වුනා. මහත්තයාව සුව කර ගන්න නොයෙකුත් උත්සහ කළා.

ඒ අතර මම, දරුවන්ගේ පාසලේ විදුහල්පති තුමා හමුවී වැඩිමහල් පුතුන් දෙදෙනාගේ පාසල් නේවාසිකාගාරයේ නවාතැන් දෙන ලෙස ඉල්ලා සිටියා. විදුහල්පති තුමා කැමති වූවත්, මාව හා මල්ලීව තනිකර යන්න ලොකු පුතාලා දෙදෙනා අකමැති වුනා. 'අපි, පවුලේ හැමෝම එක්වෙලා මේ ප්‍රශ්න විසඳගත යුතුයි. දැන් ඔය දෙන්නට කරන්න තියෙන ලොකුම දේ හොඳින් පාඩම් කරලා විභාගය පාස් වෙන එක. මම, අප්පච්චිට බෙහෙත් කරලා බලාගන්නම්' කියා දරුවන්ට පැවසුවා. එයට සවන්දුන් දරුවන් දෙදෙනා නේවාසිකාගාරයේ පදිංචි වී පාඩම් කර විභාගත් ඉහලින් සමත් වුවා. ඒ වාගේම මමත් රැකියාවේ විභාග වලින් උසස් ලෙස සමත් වීමෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පරිපාලන නිළධාරී තනතුරට පත් වුනා. ටිකෙන් ටික බෙහෙත් වල පිහිටෙන් මහත්තයාගේ අසනීපයත් සුව අතට හැරුනා. කඳුළු අතරින් ජීවිතයේ සතුට ටිකෙන් ටික අත් විඳින්නට මට හැකිවුනා.

නමුදු, ඉන් වසරක් ගතවීමටත් ප්‍රථම 2000 වසරේ සිංහල අළුත් අවුරුද්දට අපි ගමේ ගිහින් නෑදෑ හිතවතුන් සමඟ සතුටු වී නැවතත් පොලොන්නරුවට පැමිණි දවසේ රෑ, මහත්තයා නැවතත් සිහි මූර්ජා වුනා. ඉක්මණින් රෝහල් ගත කලත්, අවුරුදු 49 ක කෙටි ජීවිතයට සමු දෙමින් මහත්තයා අපෙන් වෙන්වී යන්නට ගියා. එකල මට වයස අවුරුදු 45 ක්. දරුවෝ තුන් දෙනෙක් සමඟ මම මේ ලෝකයේ තනි වුනා. මහත්තයාගේ තුන් මාසයේ දානය වෙන්තෙක් දුක දරාගෙන කටයුතු කලත් මාගේ මානසික පීඩනය එන්න එන්නම් වැඩිවුනා. ඉදිරි ජීවිතය තනිව මම ගත කළ යුතු ආකාරය ගැන කල්පනා කලා.

එහිදි , දරුවන් වෙනුවෙන් නැවත්ත විවාහ නොවන බවටත්, රැකියාවට තවත් හොඳින් යොමු වීම සඳහා අධ්‍යාපන කටයුතු ඉදිරියටත් කිරීමට මම අධිෂ්ඨාන කර ගත්තා. විවෘත විශ්ව විද්‍යාලයට ඇතුලත්ව උපාධිය ලබා ගත්තා. විශ්‍රාම යන තෙක් රාජ්‍ය සේවිකාවක් ලෙස වසර 30 ක සේවය හොඳින් ලබා දීමට මට හැකි වුවා. ඒ අතර දරුවන් හොඳින් ඉගෙන ගත්තා, විවාහ වූනා, දැන් මම මුණුබුරන් සිටින ආච්චි කෙනෙක්.

රැකියාවෙන් විශ්‍රාම යාමෙන් පසුව පොලොන්නරුවේ

කුසුමා මහත්මියගේ යොමු කිරීම මත රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනම හා එක්ව 2014 වසරේ සාමාජිකත්වය ලබා ගත්තා. මුලින්ම පොලොන්නරුව බුදු මැදුර ඇතුළට යන විට, මම දැක්කේ රන්වන් පාට බුදු පිළිමයක් තැන්පත් කරලා තිබෙනවා. බුද්ධ පූජාව, හා වාදන භාණ්ඩ වාගේ කනේ හා මොකුෂො තැන්පත් කරලා තිබුණා. බෞද්ධ සංවිධානයක් වුනාට ටිකක් වෙනස් පරිසරයක් නිසා, හිතේ තිගැස්මත් සමඟම මෙතැන් මොනවගේ තැනක්ද?, මොනවද මෙතැන වෙන්නේ, මම වැරදි තැනකටද ආවේ යන හැඟීමක් ඇති වුනා. එත් කුසුමා මහත්මියව හොඳින් හඳුනන නිසා, ඇයව විශ්වාස කළා.

මම පරිපාලන නිළධාරිනියක් ලෙස රාජකාරි කරන විට ප්‍රදේශයේ පවත්වන ශාසනාරක්ෂක බළමණ්ඩල රැස්වීම් වලට සහභාගී වී තිබෙනවා. එහිදී, බුද්ධාගමේ මෙන්ම වෙනත් ආගම් වල මුවාවෙන් පවත්වන නොයෙක් සංවිධාන ගැන එම රැස්වීම් වල සාකච්ඡා වෙනවා. ඒ නිසා රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනම ගැන මම හොයලා බැලුවා. එහිදි මෙම සංවිධානය නිත්‍යානුකූල පරිදි රජයේ ලියා පදිංචිව පවත්වාගෙන යන බෞද්ධ සංවිධානයක් බව පැහැදිලි වුනා. අපි බෞද්ධයෝ ලෙස, සාමාන්‍ය ගිහි ජීවිතය ගත කරන ගමන්, අන්‍යයන්ගේ ප්‍රශ්න ගැටළු වලට සවන් දී දුක බෙදා ගනිමින්, සතුටට පත්වීම සඳහා බෝධිසත්ව මාර්ගයේ ගමන් කළ යුතු ආකාරයයි රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමෙන් කියා දෙන්නේ. සංවිධානයේ අත් පත්‍රිකා කියවමින්, කොළඹ මූලස්ථානයේ හා තායිලන්තයේ පැවති සම්මන්ත්‍රණ වලට සහභාගී වීමෙන් ඒ ගැන ඉගෙන ගතිමි.

දැන් මම පොලොන්නරුව දයා හෝසා කණ්ඩායමේ නායිකාව වී, මගේ නිවසේ හෝසා පැවැත්වීම ආරම්භ කළා. මගේ දෙමව්පියන්, මගේ පුතාලගේ පවුල්, ඥාතීන්, අසල්වාසීන් හා යමමොතෝ ක්යෝකයිචෝ සාන් හා පර්සි මහතාත් මා පවත්වන හෝසා සඳහා පැමිණියා.

අපි ධම්ම පදනමේ සාමාජිකයන් ලෙස, දැනටත් වඩා පන්සල හා සංඝයා වහන්සේව වැදගත්කොට සැලකීම, පෝය දිනයන්හි පන්සල හා සම්බන්ධ වී කටයුතු කිරීම, තමන් විශ්වයේ යථාර්තය වන ධර්මය හා බද්ධ වී ඇති බව අවබෝධ කර ගැනීම, තමන් බෝධිසත්ව චර්යයාවේ යෙදෙමින් අන්‍යයන්ව නියම ධර්ම මාර්ගයට ගැනීම, නව සාමාජිකයන්ට බුද්ධ රූපය ලබා දීම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 2 වන හා 16 පරිච්ඡේද සජ්ඣායනා කිරීම, ඔදයිමොකු සජ්ඣායනය තුලින් තම බුද්ධ ශක්තිය අවබෝධ කර ගැනීම ආදිය පුරුදු පුහුණුවේ යෙදෙනවා. එම හෝසා වැඩසටහන් ගැන හැමෝම පැහැදීමකින් කථා කරනවා.

ඒ අයුරින් රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ ඉගෙනගත් කරුණු වලට අනුව, මගේ ජීවිතයට පැමිණි ව්‍යසන වන සුළි සුළඟින් වු ආපදවත්, මත්තයාගේ රැකියාව අහිමි වීමත්, මහත්තයාගේ මිය යාමත් බුදුන් වහන්සේ මට ලබාදුන් ත්‍යාගයන් ලෙස භාර ගැනීමට හැකියාව ලැබුනා. ඒ හැම ව්‍යසනයකින්ම ලද දුක, සන්තාපය හා අත්දැකීම තුලිනුයි සිතින් හා ගතින් ශක්තිමක් කාන්තාවක් ලෙස අද මෙතැන සිටින්නට මට හැකි වුනේ. ජීවිතය ගැන ආපසු හැරී බලද්දි හොදම ජිවිතක් ගත කලා යන සතුට දැනෙනවා.

දුකින් පීඩාවට පත් වු අයට, කරුණාවන්ත වීම හා දුක වේදනාව හඳුනාගත හැකි උපේක්ෂාවත් මා ජීවිතයේ ලද අත්දැකීම් තුලින් උපයාගත් දේය.

එම අත්දැකීම් වල පිහිටෙන්, අන්‍යයන්ගේ දුකට පිහිට විය හැකි ඥානය ලබා ගත්තා. එයින් මාගේ ඉදිරි ජීවිතය තුල, රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ සාමාජිකයෙකු ලෙස, දුකින් පීඩාවට පත්ව සිටින්නාවු මිනිසුන්ගේ සිතට සතුටක් ගෙනදීමට කැපවන බව අද දින, මේ මොහොතේ මම ප්‍රතිඥා දෙමි.

අවසානයට, මාගේ දෙමව්පියන්ටත්, ආදරණීය මහත්තයාටත්, කරදර කම්කටොළු මධ්‍යයේ හොඳින් හැදුනු මාගේ විශිෂ්ඨ දරුවන්ටත්, හදවතින්ම කෘතවේදී වෙමි.

බුදුරජාණන් වහන්සේටත්, අසා සිටි ඔබ සියළුදෙනාටත් බොහොම ස්තුතියි.



*තුන් දෙනෙක් පමණක් සිට කරන හෝසාවේ, තම අදහස් ඉදිරිපත් කරන දයා මහත්මිය*

Living the

LOTUS

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
3 වන පරිච්ඡේදය

## ගිනිගත් නිවසේ උපමාව

## උපමාව කථාවක්



එක් සමයක, සිටුවරයෙකුගේ විශාල නිවසක් තිබුණි. සිටුවරයාගේ දරුවන් හා සේවකයන් විශාල පිරිසක් ජීවත් වූ එම නිවස අබලන් වී තිබුණි. එක් දිනක්, නිවස ගිනි ගත්හ. නමුත් ඒ ගැන තැකීමක් නැති දරුවන් සෙල්ලම් කරමින් සිටියි. නිවසින් පිට සිටි සිටුතුමා ඒ බව දැන ඉන්මණින් නිවසට පැමිණ කෑ ගසමින් දරුවන්ට එළියට එන්න කිව්වත්, දරුවන් ගින්න ගැන තැකීමක් නොමැතිව හොඳින් සෙල්ලම් කරමින් සිටියි.



'දරුවන්ව මේසයක් උඩ තබාගෙන හෝ එළියට ගනිමු' යැයි සිටුතුමා කල්පනා කලත්, 'අතර මඟ එක් කෙනෙකු හෝ වැටුනොත් අවධානම්' යැයි සිතා එම අදහස අත් හැරිය. ගින්නේ භයානක කම පහදදී එළියට ගැනීමට හැදුවත් දරුවන් බලන්නේවත් නැත. අවසානයට සිටුතුමා 'උපාය කෞෂලයන් භාවිතා කර දරුවන්ව අනතුරෙන් බේරා ගන්නවා හැර වෙන විකල්පයක් නැත' ලෙස කල්පනා කලහ. ඉන්පසු දරුවන් කැමතිම එළුවෙකු, මුවෙකු හා ගවයෙකු ගේ කරත්ත එළියේ තිබෙන බව දරුවන්ට පැවසූහ.



දරුවන් එසැනින්, ගිනිගෙන දැවෙන නිවෙසින් තමාම සිතා, තිබෙන්නාවූ එකම පටු දොරටුවෙන් එළියට පැමිණියා. දරුවන් හොඳින් සිටිනවා දැකීමෙන් සිටුතුමාද ඉතා සතුටට පත්විය. ඉන්පසු, දරුවන් කරදර කරමින් 'ඉස්සෙල්ලා කියපු එළුවෙකු, මුවෙකු හා ගවයෙකු ගේ කරත්ත ලබාදෙන්න' යැයි පවසයි. එවිට සිටුතුමා, ඊටත් වඩා ලොකු, වඩා හොඳ, සුදු එළෙදෙනෙකුගේ කරත්තයක් සැමටම එක හා සමානව ලබා දුන්හ.

## අර්ථ කථාව:

මෙම කථාවේ සදහන්, සිටුතුමා වන්නේ බුදුන් වහන්සේය, දරුවන් වන්නේ අපගේ ස්වරූපයයි. අබලන් වූ නිවස වන්නේ මේ ලෝකයේ අවධානම් බවයි. ගින්න වන්නේ අප ජීවිත වල ඇති වන දුක් වේදනාවන්ය. ජීවිතයේ ඇති වන දුක් වේදනාවන් ගැන දැනුමක් නොමැතිව නිතරම අප තෘෂ්ණාවෙන් වෙලී සිටියි. බුදුන් වහන්සේ එම දුක් වේදනාවන්ගෙන් අපව මුදවා ගැනීමට හදවතින්ම ප්‍රාර්ථනා කරගෙන සිටියි. ගින්නෙන් බේරී යාමට තිබෙන ඉතා පටු, එක් දොරටුවකි. එයින් මිදී එළියට පැමිණීමට නම්, බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනය අප අවබෝධ කර ගෙන, අපගේ අධිෂ්ඨානයෙන් දොරටුව හරහා පැමිණීම හැර වෙන මාර්ගයක් නැත. මේසයක් උඩ තබා එළියට රැගෙන යාමට උත්සහ කලද, තමා විසින් දුක් වේදනාව අවබෝධ කර ගෙන නොසිටියි නම්, කොපමණ උත්සහ කළද දුකින් මුදවා ගැනීමට නොහැකිව ගිහිලී වැටෙන්නට පුළුවන. එහිදී, මුලින්ම තම දුක් වේදනාව අවබෝධ කර ගන්න යැයි, බුදුන් වහන්සේ පවසයි. නමුදු අපි ඒ ගැන අවබෝධ කර නොගනී. බුදුන් වහන්සේගේ මුහුණ දෙස බලාගෙන සිටියද, හදවතින්ම ධර්මයට සවන් දෙන්නට උත්සහ නොගනී.

අවසානයට බුදුන් වහන්සේ, එළුවෙකුගේ මුවෙකුගේ හා ගවයෙකුගේ කරත්ත අපට ලබාදෙයි. 'තමාට හොඳින්ම ගැලපෙන ධර්මය මුලින්ම ඉගෙනගනිමු' ලෙස පෙන්වා දීමෙන්, මුලින්ම ධර්මයට හිත යා කරයි.

ගිනි ගන්නා නිවසින්, තම අධිෂ්ඨානයෙන් බේරී එලියට එනවා යනු, තමාම ධර්මය පුහුණුවීම අරමුණු කිරීමයි. නමුත්, තවමත් තමා දුකින් මිදී ඇති බවට අවබෝධයක් නොමැතිව, තමා කැමතිම වාහනය පමණක් ඕනේ යනුවෙන් ප්‍රාර්ථනා කරමින් සිටියි. නමුත් බුදුන් වහන්සේට හදවතින්ම තම ප්‍රාර්ථනය පැවසූ විට, හිතා ගැනීමටවත් නොහැකි ආකාරයට මහා සුදු එළදෙනෙකුගේ කරත්තය වන, නිර්වාණය සැමට එක සමාන ආකාරයෙන් ලබා ගත හැකිවේ. තමාට හොඳින්ම ගැලපෙන් ආකාරයේ ධර්ම පුහුණුවේ යෙදීමෙන් කාහට වුවද ධර්මාවබෝධය ලබා ගැනීමට හැකිවේ.

අපව තම දරුවන් මෙන් රැකබලා ගනිමින්, දුක් වේදනාවෙන් මුදවා ගැනීමට බුදුන් වහන්සේ කටයුතු කරයි. මේ ලෝකය දුක් ගැහැට වලින් පිරී ඇත්තේ ගිනිගත් නිවසක් මෙනි. බුදුන් වහන්සේ එම ගින්නට තම ජීවිතය කැප කරමින් අපි සැමටම බුද්ධ මාර්ගය පෙන්වා දෙයි.

සංස්කරන සහය Chuo Academic Research Institute

# Greetings from Rev. Mizutani

## අවුරුදු 6 ක කාලයක් බොහොම ස්තූතියි

මේ වසරේ මුලස්ථාන කාර්ය මණ්ඩලයේ ස්ථාන මාරුවත් සමගම, මටත් රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථානයෙන් ඈත් වීමට සිදුවිය. මෙය අවස්ථාවක් කර ගෙන අවුරුදු 6 ක කාලයක් ඔබ සියළුදෙනාගෙන් ලද උදව් උපකාර වලට මාගේ හදපිරි කෘතවේදිතාව පිරිනමමි. මේ සෑම දිනයක්ම මම ඉතා සතුටින් ගත කරමින්, ලෝකයේ නොයෙක් ප්‍රදේශ වල සාමාජිකයන් සමඟ හමුවී, ධර්මය බෙදහද ගත් ප්‍රමෝදය අමතක නොවේ.

මෙවර, දකුණු ආසියානු ධර්ම ව්‍යාප්ත අධ්‍යක්ෂක හා තායිලන්ත ශාඛා ප්‍රධානී ලෙස වගකීම් භාර විය. රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ කියාදීම් ඉතාමත් විශිෂ්ඨය. නව ස්ථානයක, මෙම විශිෂ්ඨ වූ ධර්මය එක් අයෙකු හෝ වැඩි පිරිසකට කියාදෙන්නට සතුටින් බලා සිටිමි.

නව අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී ලෙස කෝයිචි සයිතෝ මහතා පත්වේ. මාගේ සුහද මිත්‍රයෙකු වන එතුමා, ඉතා කාරුණික ධර්ම නායකයෙකි. එතුමා 20 වසරක් ශාඛා ප්‍රධානී ලෙස ඇමෙරිකාවේ නිව්යෝර්ක් ශාඛාවේ, මෙන්ම ජපානය තුළද කටයුතු කර ඇත. එතුමාගේ ශරීරය මෙන්ම හදවතද ප්‍රමාණයෙන් විශාලය. එතුමාගේ නායකත්වයෙන්, මීටත් වඩා ලෝකය පුරා ධර්මය ව්‍යාප්ත වේවි යැයි මහත් බලාපොරොත්තුවෙන් සිටිමි.

ඔබ සියළුදෙනාට, නිදුක් නිරෝගිබව ප්‍රාර්ථනා කරමි. එසේම ජීවිතය තිබෙන තුරු, ධර්මයේ සතුට එක් අයෙකු හෝ වැඩි පිරිසකට ප්‍රචලිත කරමු. බොහොම ස්තූතියි.

**ශෝකෝ මුසුතනි මහතා**



*සයිතෝ මැතිතුමා හා මිසුතනි මැතිතුමා*




# සුභ දවසක් වේවා. සියළුදෙනාගෙන්ම අවසරයි.

**කෝයිචි සයිතෝ මහතාගේ චරිතාපදානයෙන් බිඳක්**

1975 වර්ෂයේ තෝකියෝ නුවරදී සයිතෝ කෝයිචි සයිතෝ මහතා උපත ලැබීය. රිෂ්ෂෝ කෝසෙයි ගකුරින් පාසලේ අධ්‍යාපනය අවසන් කර, WCRP හි අන්‍ය ආගමික සහජීවනය අංශයේ කටයුතු කරමින් ජර්මනියේද සේවය කලහ.

1998 වසරේ සිට මේ දක්වා ජපානය තුල හා විදේශීය රටවලට ශාඛා ප්‍රධානී ලෙස කටයුතු කරමින් පැමිණියහ.

දෙසැම්බර් මස 01 වන දින සිට රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධාන තනතුරට පත් වූ මම, කෝයිචි සයිතෝ වෙමි. ගිය නොවැම්බර් මස වෙනතෙක් මූලස්ථානයේ සිටි යුසුකේ සයිතෝ මාගේ පුතාය. අන්තර්ජාතික මූලස්ථානයේ කටයුතු කිරීමට ලැබීම ගැන මම ඉමහත් සතුටට පත්වෙමි.

මම අවුරුදු 16 ක කාලයක් WCRP අන්‍ය ආගමික සහජීවන අංශයේ සේවය කිරීමෙන් පසුව, ශාඛා ප්‍රධානී ලෙස ගිබතා, ඇමෙරිකාවේ නිව්යෝර්ක්, සුමිද හා හිරෝෂිමා ශාඛාවල අවුරුදු 19 ක් සේවය කලෙමි. එහිදී යුද්ධයෙන් හා ත්‍රස්තවාදී ක්‍රියා වලින් මියගිය අය වෙනුවෙන් නිතරම සූත්‍ර සජ්ඣායනය කර පින් අනුමෝදන් කිරීම තුලින් සාමයේ වැදගත්කම හොඳින්ම අවබෝධ විය.

රි.කෝ.කෝ. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී ලෙස, නිර්මාතෘ තුමාගෙන් අපට පැවරුණ වගකීම වන 'රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය පෙරටු කර ගෙන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෝකය පුරාම ව්‍යාප්ත කිරීම'ට ඉදිරියටත් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

මෙම අවධියට යෝග්‍ය මානව සම්පත් නිර්මාණය = ලෝකය පුරා බෝධිසත්වයන් නිර්මාණය කිරීම = යන රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ බෝධිසත්ව චර්යයාව වෙනුවෙන්, අපි සියළුදෙනාම එක්ව පියවර නගමු.

**රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී**
**කෝයිචි සයිතෝ මහතා**




RISSHO KOSEI-KAI INTERNATIONAL BRANCHES

We welcome comments on our e-newsletter Living the Lotus.
Please send us your comments to the following e-mail address.
E-mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai Overseas Dharma Centers 2017

**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street Suite #1 Los Angeles CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way,
WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, USA
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel*: (727) 560-2927 *e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona,
HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/~rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446/55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100 Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Taichung**

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701 Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Rissho Kosei-kai of Pingtung**

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Rissho Kosei-kai of South Asia Division**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi,
110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka, New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna Dharma Center**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218 *e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station: Mirshari,
District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax*: 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Other Groups**
**Rissho Kosei-kai Friends in Shanghai**